# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශේෂ

අංක 2459/24 - 2025 ඔක්තෝබර් මස 22 වැනි බදාදා - 2025.10.22

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


## I වැනි කොටස: (I) වැනි ඡේදය - සාමාන්‍ය

### රජයේ නිවේදන

**ශ්‍රී ලංකා ග්‍රාම නිලධාරී සේවයේ සේවා ව්‍යවස්ථා සංග්‍රහය**

01 වන සංශෝධනය

රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් 2024 ජුනි මස 06 වැනි දින අනුමත කරන ලද 2024 අගෝස්තු මස 02 වැනි දිනැති හා අංක 2395/49 දරන *අති විශේෂ ගැසට් පත්‍රය* මගින් පළ කරන ලද ශ්‍රී ලංකා ග්‍රාම නිලධාරී සේවයේ සේවා ව්‍යවස්ථා සංග්‍රහය පහත දැක්වෙන ආකාරයට සංශෝධනය කරනු ලැබේ. එහි සඳහන් අනෙකුත් කරුණු හා කොන්දේසි නොවෙනස්ව පවතී.

රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ අනුමැතිය පරිදි,

**ඩබ්ලිව්. එච්. එම්. එම්. සී. කේ. දයාරත්න,**
ලේකම්,
රාජ්‍ය සේවා කොමිෂන් සභාව.

2025 ඔක්තෝබර් මස 22 වැනි දින.

1. ක්‍රියාත්මක වන දිනය : මෙම සේවා ව්‍යවස්ථා සංග්‍රහය 2025 ඔක්තෝබර් මස 15 වැනි දින සිට ක්‍රියාත්මක විය යුතුය.

5. වැටුප්:

| | | |
|---|---|---|
| 5.1 වැටුප් කේත අංකය: | III, II, හා I ශ්‍රේණි | GN 1 – 2025 |
| | අධි ශ්‍රේණිය | GN 2 – 2025 (නව) |



*මෙම අති විශේෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

5.2 වැටුප් පරිමාණය: III,II හා I ශ්‍රේණි
රු.50,630 – 10 X 540 – 11 X 630 – 10 X 1,010 – 10 X 1,190 -84,960

අධි ශ්‍රේණිය
රු.72,600 – 10 X 1,360 – 18 X 1,850 - 119,500

5.3 ශ්‍රේණි ක්‍රමයට අදාළ ආරම්භක වැටුප් පියවර:

GN – 1 – 2025

| *ශ්‍රේණිය* | *ආරම්භක වැටුප් තලය* | *ආරම්භක වැටුප් පියවර* |
|---|---|---|
| III | රු.50,630.00 | පියවර 01 |
| II | රු.56,660.00 | පියවර 12 |
| I | රු.63,970.00 | පියවර 23 |

GN – 2 – 2025(නව)

| *ශ්‍රේණිය* | *වැටුප් තලය* | *වැටුප් පියවර* |
|---|---|---|
| අධි ශ්‍රේණිය | රු.72,600.00 | පියවර 01 |

6. සේවා ගණයට අයත් තනතුර/ තනතුරු:

6.1 අනුමත තනතුරු නාම හා අනුමත තනතුරු සංඛ්‍යාව (කළමනාකරණ සේවා අධ්‍යක්ෂ ජනරාල් විසින් අනුමත පරිදි වේ.)

| *අනුමත තනතුරු නාම* | *තනතුර අනුමත ශ්‍රේණිය* | *වැටුප් කේතය* | *අනුමත තනතුරු සංඛ්‍යාව* |
|---|---|---|---|
| ග්‍රාම නිලධාරි | ශ්‍රී ලංකා ග්‍රාම නිලධාරි සේවය I/ II/ III ශ්‍රේණි | GN – 1 – 2025 | 14039 |
| පරිපාලන ග්‍රාම නිලධාරි | ශ්‍රී ලංකා ග්‍රාම නිලධාරි සේවය (අධි ශ්‍රේණිය) | GN – 2 – 2025 (නව) | 340 |

10.1.2.උසස් කිරීමේ පරීක්ෂණය සමත් වන්නන් III ශ්‍රේණියෙන් II ශ්‍රේණියට උසස් කිරීම.

i. උසස් කිරීමේ පරීක්ෂණයට සුදුසුකම් සලකා බලනු ලබන දිනට හෝ ඊට පෙරාතුව අවම වශයෙන් III ශ්‍රේණියේ වසර 3ක සක්‍රීය හා සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර ඇත්තාවූත් වැටුප් වර්ධක 3ක් උපයාගෙන ඇත්තාවූත් සේවයේ ස්ථිර කිරීමට වෙනත් අයුරකින් නුසුදුසු නොවන්නාවූත් නිලධරයන්ට උසස් කිරීමේ පරීක්ෂණයට අයදුම් කිරීමට/ පෙනී සිටීමට අවකාශය ඇති අතර උසස්වීම් ලැබීම සඳහා මෙම පරීක්ෂණයෙන් සමත්වීමට අමතරව 10.1.2.1 යටතේ දක්වා ඇති සුදුසුකම් සපුරාලීම අනිවාර්ය වේ.

10.1.2.1 සලකා බලනු ලබන සුදුසුකම්:

i. පත්වීම ස්ථිර කර තිබීම.

ii. සේවා ගණයේ III ශ්‍රේණියේ අවම වශයෙන් වසර පහක (05) සක්‍රීය හා සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම හා වැටුප් වර්ධක පහක් (05) උපයාගෙන තිබීම.

iii. අනුමත කාර්ය සාධන ඇගයීමේ පටිපාටිය අනුව උසස් කිරීමේ දිනට පෙරාතුව වූ වසර පහක (05) තුළ සතුටුදායක මට්ටමේ හෝ ඊට ඉහළ කාර්ය සාධනයක් පෙන්නුම් කර තිබීම.

iv. රාජ්‍ය සේවා කොමිෂන් සභා චක්‍රලේඛ අංක 01/2020 හා ඊට ආනුෂංගික චක්‍රලේඛයන්හි සඳහන් විධිවිධානයන්ට අනුකූලව විනයානුකූලව දඬුවමක් ලබා නොතිබිය යුතුය.

v. අදාළ කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය සමත් වී තිබීම.

vi. අදාළ මට්ටමේ අනෙක් රාජ්‍ය භාෂා ප්‍රවීණතාවය ලබා තිබීම.

vii. පරිශිෂ්ට 08 හි සඳහන් II ශ්‍රේණියට උසස් කිරීමේ විභාගය සමත් වී තිබීම.

*සටහන*

මෙම විභාගය සඳහා පෙනී සිටිය හැක්කේ එක් වාරයකදී පමණි.

18. අන්තර්කාලීන විධිවිධාන

18.1 2016.09.03 දින පැවති ග්‍රාම නිලධාරි බඳවා ගැනීමේ විභාගයේ ප්‍රතිඵල මත බඳවාගන්නා ලදුව මෙම ව්‍යවස්ථා සංශෝධනය ප්‍රකාශයට පත් කිරීමෙන් අනතුරුව පවත්වන II ශ්‍රේණියට උසස් කිරීමේ විභාගය සමත්වන නිලධාරීන් පහත පරිදි II ශ්‍රේණියට උසස් කරනු ලැබේ.

i. II ශ්‍රේණියට උසස් කිරීමේ විභාගයෙන් සමත්වන නිලධාරීන් 10.1.2.1 හි සඳහන් සුදුසුකම් සම්පූර්ණ කර ඇත්නම්; උසස් කිරීමේ විභාගය සමත්වූ දිනය හෝ III ශ්‍රේණියේ වසර පහක (05) සක්‍රීය හා සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කරනු ලබන දිනය යන දින දෙකෙන් පසුව එළැඹෙන දිනයේ සිට II ශ්‍රේණියට උසස් කරනු ලැබේ. එම නිලධාරීන් උසස් කිරීමේ විභාගය සමත් වූ දිනට පෙර සම්පූර්ණ කර ඇති III ශ්‍රේණියේ වසර පහකට (05) වැඩි සක්‍රීය හා සතුටුදායක සේවා කාලය උසස් කිරීමේ කාර්යයන් සඳහා II ශ්‍රේණියේ සේවා කාලයක් ලෙස සලකනු ලැබේ.

18.2 2007.03.10 දින හා 2013.05.04 යන දිනවල පැවති ග්‍රාම නිලධාරි බඳවා ගැනීමේ විභාගවල ප්‍රතිඵල මත III ශ්‍රේණියට බඳවාගන්නා ලද නිලධාරීන්ටද මෙම ව්‍යවස්ථා සංශෝධනය ප්‍රකාශයට පත් කිරීමෙන් අනතුරුව පළමුවරට පවත්වන II ශ්‍රේණියට උසස් කිරීමේ විභාගයට මුහුණ දිය හැක. එම උසස් කිරීමේ පරීක්ෂණය සමත්වන II ශ්‍රේණියේ නිලධාරීන් පහත සඳහන් පරිදි I ශ්‍රේණියට උසස් කරනු ලැබේ.

i. උසස් කිරීමේ විභාගයෙන් සමත්වන නිලධාරීන්, 10.2.1.1 හි සඳහන් සුදුසුකම් සම්පූර්ණ කර ඇත්නම් විභාගය පැවැත්වූ දිනය හෝ II ශ්‍රේණියේ වසර පහක (05) සක්‍රීය හා සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කරනු ලබන දිනය යන දින දෙකෙන් පසුව එළැඹෙන දිනයේ සිට I ශ්‍රේණියට උසස් කරනු ලැබේ. එම නිලධාරීන් උසස් කිරීමේ විභාගය සමත් වූ දිනට පෙර සම්පූර්ණ කර ඇති වසර පහකට (05) වැඩි සේවා කාලය ද ඇතුළුව මුළු සේවා කාලය වසර පහළොවකට (15) වඩා වැඩි සක්‍රීය හා සතුටුදායක සේවා කාලය උසස් කිරීමේ කාර්යයන් සඳහා I ශ්‍රේණියේ සේවා කාලය ලෙස සළකනු ලැබේ.

පරිශිෂ්ට 08

ශ්‍රී ලංකා ග්‍රාම නිලධාරී සේවයේ III ශ්‍රේණියේ නිලධරයන් II ශ්‍රේණියට උසස් කිරීමේ පරීක්ෂණය

01. පරීක්ෂණය පිළිබඳ විස්තර

| *ප්‍රශ්න පත්‍රය* | *කාලය* | *මුළු ලකුණු* |
|---|---|---|
| 1. ආයතන කාර්ය, කාර්ය පටිපාටික රීති සහ මූල්‍ය ක්‍රම | පැය 2 | 100 |
| 2. ග්‍රාම නිලධාරි රාජකාරි සඳහා අදාළ වන නීති රීති පිළිබඳ අවබෝධය | පැය 2 | 100 |

*සටහන:*

i. සියලුම උත්තර පත්‍රවල නොපැහැදිළි අත් අකුරුවලට සහ අක්ෂර වින්‍යාස දෝෂවලට ලකුණු අඩු කරනු ලැබේ. කියවීමට නොහැකි ලෙස අකුරු ලියා ඇති අපේක්ෂකයෝ නුසුදුස්සන් කරනු ලබති.

ii. සේවයට ඇතුළුවීම සඳහා වූ තරඟ පරීක්ෂණයකට තමා පෙනී සිටි භාෂා මාධ්‍යයෙන්ම අපේක්ෂකයන් මෙම ප්‍රශ්න පත්‍රවලට පිළිතුරු ලිවිය යුතුය.

iii. මෙම තරඟ විභාගයෙන් සමත්වීම සඳහා සෑම විෂයයකටම අවම වශයෙන් ලකුණු සියයට හතළිහක් (40%)ක් සහ විෂයයන් දෙක (02) සඳහාම මුළු ලකුණු 100ට නොඅඩුව එකම විභාගයේදී (එක් වාරයකදී) අපේක්ෂකයන් විසින් ලබා ගත යුතුය.

02. පවත්වන බලධරයා : විභාග කොමසාරිස් ජනරාල් හෝ පත්වීම් බලධරයා විසින් නම් කරනු ලබන ආයතනයක්.

03. පරීක්ෂණය සඳහා වන විෂය නිර්දේශය :

| *ප්‍රශ්න පත්‍රය* | *විෂය නිර්දේශය* |
|---|---|
| 1. ආයතන කාර්ය, කාර්ය පටිපාටික රීති සහ මූල්‍ය ක්‍රම | කාර්යාල ක්‍රම පිළිබඳව මූලධර්ම, ඒවායෙහි වැදගත්කම, ලිඛිත සන්නිවේදනය, ලිපිගොනුකරණය හා ආකෘති සම්පාදනය යනාදී විෂය ක්ෂේත්‍ර ආවරණය වන පරිදි රජයේ කාර්යාලවල ක්‍රියාත්මක වන කාර්යාල ක්‍රම පිළිබඳ දැනුම හා කාර්යාල කටයුතුවල දී ලබාගත් අත්දැකීම්වල ප්‍රවීණතාවය පරීක්ෂා කිරීම,<br><br>රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්ය පටිපාටික රීතින් හි I වන කාණ්ඩය හා ආයතන සංග්‍රහයේ I වන කාණ්ඩයේ අන්තර්ගත කරුණු පිළිබඳ දැනුම පරීක්ෂා කිරීම,<br><br>රජයේ දෙපාර්තමේන්තු හා අමාත්‍යාංශ කාර්යාලවල භාවිතා වන මුදල් පාලනය, මුදල් භාරකාරත්වය, ආදායම් හා ගෙවීම්, අයවැය ඇස්තමේන්තු, සැපයුම් වැඩ සේවා,භාණ්ඩ සමීක්ෂණය හා ගබඩාකරණය යන විෂය පිළිබඳව දැනුම හා අවබෝධය විභාග කිරීම, අරමුණු කර ගත් ප්‍රශ්නවලින් මෙම ප්‍රශ්න පත්‍රය සමන්විත වේ. |
| 2. ග්‍රාම නිලධාරි රාජකාරි සඳහා අදාළ වන නීති රීති පිළිබඳව අවබෝධය | ග්‍රාම නිලධාරීන්ට විවිධ අණපනත් හා අමාත්‍යාංශ, දෙපාර්තමේන්තු, පළාත් සභා හා වෙනත් රජයේ ව්‍යවස්ථාපිත ආයතන මඟින් පැවරී ඇති රාජකාරි පිළිබඳව දැනුම පරීක්ෂා කරන අතර එම විෂයන්ට අදාළ සිද්ධීන් සම්බන්ධව සිද්ධි අධ්‍යයනය,<br><br>කාලීන සමාජීය සිදුවීම් පිළිබඳව අවබෝධ කොට ගෙන විග්‍රහ කර දැක්වීමේ හැකියාව මැනීම,<br><br>අරමුණු කර ගත් ප්‍රශ්නවලින් මෙම ප්‍රශ්න පත්‍රය සමන්විත වේ. |

විෂය නිර්දේශය හා ඉල්ලුම් කරන ආකාරය පිළිබඳව සම්පූර්ණ විස්තර දැන ගැනීම සඳහා පත්වීම් බලධරයා විසින් වරින්වර ප්‍රසිද්ධ කරනු ලබන ගැසට් නිවේදන කෙරෙහි විභාග අපේක්ෂකයන්ගේ සැළකිල්ල යොමු විය යුතුය.

EOG 10 - 0225

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.